සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී. එල්. සී

2025 මාර්තු 31 දිනට විගණනය කරන ලද මූල්‍ය වාර්තාව

අර්නස්ට් ඇන්ඩ් යං,
වරලත් ගණකාධිකාරිවරු,
රොටුන්ඩා ටවර්ස්,
අංක 109, ගාලු පාර,
තැ.පෙ. 101, කොළඹ 03.
ශ්‍රී ලංකාව.

දුරකථන : +94112463500
ෆැක්ස් : +94117687869
ඊමේල් : eysl@lk.ey.com

සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී, කොටස්කරුවන් වෙත මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ වාර්තා

අදහස

සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී (සමාගම) හි මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කර ඇති අතර එයට 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ ලාභ හෝ අලාභ ප්‍රකාශය සහ අනෙකුත් විස්තීර්ණ අදයම් ප්‍රකාශය, කොටස් හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශ සහ එදිනට අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වේ.

අපගේ අදහස අනුව, මේ සමග ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2025 මාර්තු 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යය සාධනය සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිතීන්ට අනුව ලබාදේ.

අදහස සඳහා පදනම

අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව සිදුකර ඇත. ඉහත ප්‍රමිති තත්ත්වයන් යටතේ වන අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණනය සඳහා වන වගණනයේ වගකීම් හි තවදුරටත් විස්තර කොට ඇත. අප ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ, වෘත්තිය ගණකාධිකාරිවරුන් සඳහා වන චර්යාධර්ම පද්ධතියට (චර්යාධර්ම පද්ධතිය) අනුකූලව සමාගමෙන් ස්වායත්තව කටයුතු කරන අතර, එම චර්යාධර්ම පද්ධතිය අනුව, අපගේ වෙනත් චර්යාධාර්මික වගකීම් ද සාර්ථකව සම්පූර්ණ කර ඇත. අපගේ අදහස් හා මතය ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට අප ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත හා සුදුසු තරමේ වන බව අපගේ විශ්වාසය වේ.

ප්‍රධාන විගණන කරුණු.

ප්‍රධාන විගණන කරනු ලෙස සැලකෙන්නේ අපගේ වෘත්තියමය විනිශ්චයට අනුව වර්තමාන කාල පරිච්ඡේදය තුළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණනයේ ඇති වැදගත්ම සාධක හා කරුණු වන්නේය. මෙම කරුණු අපගේ මූල්‍ය ප්‍රකාශන විගණනයේ සන්දර්භය තුළ ආමන්ත්‍රණය කරන ලද අතර, ඒ පිළිබඳව අපගේ මතය දැනුම් දෙනු ලබන අතර, මෙකී කරුණු පිළිබබඳව වෙනම අදහසක් අප ඉදිරිපත් කර නොමැත.

පහත එක් එක් කරුණ සඳහා අපගේ විගණනය එම කරුණ සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වූ අකාරය පිළිබඳ අපගේ විස්තරය, එම සන්දර්භය තුළ සපයනු ලැබේ.

මෙම කරුණු සම්බන්ධයෙන් ඇතුළුව, අපගේ වාර්තාවේ මූල්‍යප්‍රකාශන විගණනය අංශයේ විගණකගේ වගකීම්හි විස්තර කර ඇති වගකීම් අපි ඉටු කර ඇත්තෙමු. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනයන්හි ද්‍රව්‍යමය අවප්‍රකාශ ලබා ගැනීමේ අවදානම පිළිබඳ අපගේ තක්සේරුවට ප්‍රතිචාර දැක්වීම සඳහා නිර්මාණය කර ඇති ක්‍රියාපටිපාටීන්ගේ කාර්යය සාධනය අපගේ විගණනයට ඇතුළත් විය. පහත කරුණු වෙත ප්‍රතිචාර දැක්වීම සඳහා සිදු කරන ලද ක්‍රියාපටිපාටි ඇතුළුව අපගේ විගණන ක්‍රියා පටිපාටීන්ගේ ප්‍රතිඵල, ඒ සමග ඇති මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණන මතයට පදනම සපයයි.

ප්‍රධාන විගණන කරුණු	ප්‍රධන විගණන කරුණු වෙත අපගේ විගණනය ප්‍රතිචාර දැක්වූ ආකාරය
ණය සහ කල්බදු අයවිය යුතු ලැබීම් හි අපේක්ෂිත ණය අලාභ සඳහා වෙන්කිරීම් ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් මැනීම. ණය සහ කල්බදු අයවිය යුතු ලැබීම් හි අපේක්ෂිත ණය අලාභ සඳහා වෙන්කිරීම් පිළිවලින් සටහන් 18.4, 18.3 සහ 18.2 හි දක්වා ඇති පරිදි ක්‍රමක්ෂය කළ පිරිවැයට අනුව මනිනු ලබන අතර, මූල්‍ය ප්‍රකාශනයේ සටහන 9 හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මත කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ. පහත කරුණු හේතුවෙන් මෙය ප්‍රධාන විගණනය කරුණක් විය. ● අයවිය යුතු ණය සහ කල්බදු ආපසු අයකර ගැනීම සඳහා, අනාගත මුදල් ප්‍රවාහනය ඇස්තමේන්තු කිරීමේදී සම්බන්ධ වන සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතාවයේ මට්ටම, සහ ● අපේක්ෂිත ණය අලාභ සඳහා වාර්තා කරන ලද වෙන්කිරීම් ප්‍රමාණයේ ප්‍රමාණාත්මකභාවය. ණය සහ කල්බදු අයවිය යුතු ලැබීම් සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා වෙන්කිරීම් තක්සේරු කිරීමේ දී කළමනාකරණ විසින් භාවිතා කරන සැලකිය යුතු විනිශ්චයන්, උපකල්පනය සහ ඇස්තමේන්තු හි ප්‍රධාන ක්ෂේත්‍ර අතරට ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික අවස්ථා සහ ඒවාට අදාළ බර තැබීම් ඇතුළත් වේ. මේවා නෛසර්ගිකව ඉහළ යන ඇස්තමේන්තු අවිනිශ්චිතතා මට්ටම්වලට සහ විෂයබද්ධතාවයන්ට යටත් වේ.	ණය සහ කල්බදු අයවිය යුතු ලැබීම් හි අපෙක්ෂිත ණය පැහැරහැරීම් සඳහා වෙන් කිරීම්වල ප්‍රමාණවත්භාවය වෙත ප්‍රතිචාර දැක්වීමේදී අපගේ විගණන ක්‍රියා පටිපාටීන්ට පහත සඳහන් ප්‍රධාන ප්‍රමුඛතා ඇතුළත් විය. ● අපගේ වාර්තාවේ දිනය දක්වා ඇති හොඳම තොරතුරු මත, සමාගමේ අනුකූලතාවය, අපේක්ෂිත ණය අලාභ වෙන්කිරීම් ගණනය කිරීම් සහ ආර්ථික තත්ත්වයට ප්‍රතිචාර දැක්වීම් ඇතුළුව පහත සඳහන් ක්‍රමවේදය තක්සේරු කරන ලදී. ● අපේක්ෂිත ණය අලාභ ඇස්තුමේන්තු කිරීම පිළිබඳ පාලනයන්හි සැලසුම, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඇගයීමට ලක් කරනු ලද අතර, එයට අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් අපේක්ෂිත ණය අලාභ, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සඳහා අධීක්ෂණ මට්ටම තක්සේරු කිරීම, සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම ඇතුළත් විය. ● සමාගමේ අදළ මූලාශ්‍ර ලේඛන සහ ගිණුම්කරණ වාර්තා හරස් ආවේක්ෂණය මගින් අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම් වලදී භාවිතා කරන පාදක වූ දත්තයන්හි සම්පූර්ණත්වය, නිරවද්‍යතාවය සහ සාධාරණත්වය පරීක්ෂා කරන ලදී. ● ණය තත්ත්ව තක්සේරු කිරීම් සහ අදළ අදියර වර්ගීකරණයන්හි සාධාරණත්වය ඇගයීමට ලක් කරන ලදී..

ප්‍රධාන විගණන කරුණු	ප්‍රධාන විගණන කරුණු වෙත අපගේ විගණනය ප්‍රතිචාර දැක්වූ ආකාරය
ප්‍රධාන ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චයන් පිළිබඳ වැඩිදුර තොරතුරු සටහන 09 හි අනාවරණය කර ඇත.	● ඉහත කරුණුවලට අමතරව පහත ක්‍රියා පටිපාටි ඉටු කරන ලදී. අඩුපාඩු සඳහා සාමූහික පදනමක් මත තක්සේරු කරන ලද ණය සහ කල්බදු අයවිය යුතු ලැබීම් සඳහා ● අපේක්ෂිත ණය පාඩු සඳහා අඩුපාඩු සහිතව භාවිතා කරන ප්‍රධාන යෙදවුම් සහ ගණනය කිරීම් පරීක්ෂා කරන ලදී. ● පාදක වූ ක්‍රමවේදය සහ කළමනාකරණ ආවරණ තුළ කළමනාකරණය විසින් භාවිතා කරන විනිශ්චයයන්, උපකල්පන සහ ඇස්තමේන්තුවල සාධාරණත්වය තක්සේරු කරන ලදී. අපගේ පරීක්ෂණයට භාවිතා කරන ලද ඉදිරි දැක්ම, තොරතුරුවල සාධාරණත්වය, සලකා ලබන ලද ආර්ථික අවස්ථා සහ එක් එක් අවස්ථාවට පවරා ඇති සම්භාවිතා බර තැබීමේ සාධාරණත්වය තක්සේරු කිරීම ඇතුළත් විය. ● 18.1, 18.2, 18.3, 18.4 සහ 37.1.1 සටහන්වල දක්වා ඇති අදළ මූල්‍ය ප්‍රකාශන හෙළදරව් කිරීම්වල ප්‍රමාණවත් බව තක්සේරු කරන ලදී.
මූල්‍ය වාර්තාකරනය අදළ තොරතුරු තාක්ෂණ (IT) පද්ධතිය ආශ්‍රිත අභ්‍යන්තර පාලනයන් සමාගෙම් මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය IT පද්ධතිය සහ ඒ ආශ්‍රිත අභ්‍යන්තර පාලනයන් මත සැලකිය යුතු ලෙස රඳ පවතියි. තවද, ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙරිදරව් කිරීම් සකස් කරනු ලබන්නේ IT පද්ධතිය මගින් ජනනය කරන ලද දත්ත සහ වාර්තා භාවිතා කරමිනි. ඒවා පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කරනු ලැබේ. ඒ අනුව මූල්‍ය වාර්තාකරණය අදළ IT පද්ධතිය ආශ්‍රිත අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් ලෙස සලකනු ලැබිය.	අපගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියාපටිපාටි ඇතුළත් විය. ● මූල්‍ය වාර්තාකරණය සහ අදළ හෙලිදරව් කිරීම්වලට අදළ, සැලකිය යුතු ක්‍රියාවලින්ගේ දුර්වල අන්තර් පාලන පරිසරය පිළිබඳ අවබෝධයක් ලබාගත් අතර පරීක්ෂා කරන ලද ප්‍රධාන පාලනයන් පරීක්ෂා කරන ලදී. ● අපගේ අභ්‍යන්තර විශේෂිත සම්පත් සම්බන්ධ කරගත් අතර, ● සමාගමේ තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී. ● හඳුනාගත් මූල්‍ය වාර්තාකරණය, පරිශීලක ප්‍රවේශය සහ වෙනස් කිරීමේ කළමනාකරණයට අදළව තොරතුරු තාක්ෂණ පද්ධතියට අදළ අභ්‍යන්තර පාලනයන් හි සැලසුම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඇගයීමට ලක්කර පරීක්ෂා කරන ලද, සහ ● මූලික වශයෙන් විමසීම් හරහා සමාගමට බලපාන සයිබර් ආරක්ෂණ අවදනම් සහ මෙම අවදනම් විසඳීමට ගත් ක්‍රියාමාර්ග පිළිබඳ ඉහළ මට්ටමේ අවබෝධයක් ලබාගත්තා ලදී. සාමාන්‍ය ලෙජර ප්‍රතිසන්ධාන සාමලෝචනය ඇතුළුව, නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සඳහා හෙළිදරව් කිරීම් ජනනය කිරීමට භාවිතා කරන වාර්තාවල මූලාශ්‍ර දත්ත පරීක්ෂා කරන ලදී.

වෙනත් තොරතුරු

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී හි මූල්‍ය ප්‍රකාශන, 2024 මැයි 24 වන දින එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වෙනස් නොකළ මතයක් ප්‍රකාශ කළ තවත් විගණකවරයෙකු විසින් විගණනය කරන ලදී.

සමාගමේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරු සඳහා සමාගමේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ අපගේ විගණක වාර්තාව හැර, අනෙකුත් තොරතරු සඳහා කළමනාකරණය වගකිය යුතුය. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික කිරීමේ නිගමනයන් ප්‍රකාශ නොකරමු.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණනයන් සම්බන්දයෙන් ගත් කළ වෙනත් තොරතරු කියවීම අපගේ වගකීම වන අතර, එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග, පදර්ථමය වශයෙන් නොගැළපෙන බව හෝ විගණනයේදී විගණනය පිළිබඳව ලබාගත් අපගේ දැනුම හෝ වෙනයම් ආකරයක දැනුම ද්‍රව්‍යමය ලෙස දුශ්ප්‍රකාශිතව දිස්වීම සලකා බලනු ලැබේ. අප විසින් සිදුකරන ලද කාර්යයන් මත පදනම්ව ද්‍රව්‍යමයව දුශ්ප්‍රකාහිත වීමක් සිදු වි ඇති බව අප නිගමනය කර ඇත්නම් ඒ බව වාර්තා කිරීමට අපට අවශ්‍ය වේ. මේ හා සම්බන්ධව වාර්තා කිරීමට අපට කිසිවක් නැත.

මූල්‍ය ප්‍රකාශ සඳහා පාලනය භාරව සිටින බලධාරීන්ගේ සහ කළමනාකාරිත්වයේ වගකීම්,

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධන දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පාලනාධිකාරිගේ වගකීම වන අතර, වංචාවක් හෝ ද්වේෂයක් හේතුවෙන් සිදුවිය හැකි ද්‍රව්‍යමය දුශ්ප්‍රකාශනයන්ගෙන් තොර, මූල්‍යප්‍රකාශන පිළියෙල කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වෙයි.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සමාගම අඛන්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කිරීම, අදළ වන පරිදි අඛණ්ඩ පැවැත්මට අදළ කරුණු හෙළිදරව් කිරීම සහ කළමනාකරණය සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට අදහස් කරන්නේ නම් හෝ එසේ කිරීම හැර වෙනත් යථාර්තවාදී විකල්පයක් නොමැතිනම් මිස අඛණ්ඩ පැවැත්මේ ගිණුම්කරණ පදනම භාවිතා කිරීම කළමනාකරණයේ වගකීමකි. පාලනය භාරව සිටින අය සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය සඳහා වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණකවරුන්ගේ වගකීම

අපගේ අරමුණ වන්නේ වංචාව හෝ ද්වේෂ හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශ ද්‍රව්‍යමය අවප්‍රකාශවලින් තොර බව සාධාරණ ලෙස තහවුරු කිරීමක් ලබාගැනීම හා අපගේ මතයද ඇතුළත් වන විගණන වාර්තාවක් ඉදිරිත් කිරීමය. සාධාරණ හා තර්කානුකූල සහතික කිරීමක් යනු ඉහළ මට්ටමේ තහවුරු කිරීමක් හෙවත් සහතික කිරීමක් වන නමුදු එය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAuSs) වලට අනුකූලව විගණනයක් සිදු කිරීම මගින්. එවැන්නක් පවතින විට, ද්‍රව්‍යමය අවප්‍රකාශයක් සැම විටම හඳුනාගනු ලබන බවට ඇප සහතිකයක් නොවනු ඇත. අවප්‍රකාශ වංචාවන් හෝ ද්වේෂ මගින් පැන නැගිය හැකිවන අතර, පුද්ගල වශයෙන් එක් එක් වශයෙන් හෝ සමස්තයන් වශයෙන් ගත් කළ මෙම මූල්‍ය ප්‍රකාශවල පදනම මත ගත් භාවිත කරන්නන්ගේ ආර්ථික තීරණයන් වල බලපෑම් කරනු ලබනැයි සාධාරණව/හේතු සහගතව බලාපොරොත්තු විය හැකිනම් ඒවා ද්‍රව්‍යමය යැයි සලකා බලනු ලැබේ.

SLAuSs වලට අනුකූලව සිදුකරනු ලබන විගණනයක කොටසක් ලෙස අප අපගේ වෘත්තියවේදී විනිශ්චය ක්‍රියාවේ යොදවන අතර, විගණනය පුරාවටම වෘත්තිමය සංශයවාදීබව පවත්වාගෙන ගියෙමු. තවද අප විසින් :

- වංචාව හෝ ද්වේෂ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ද්‍රව්‍යමය අවප්‍රකාශයන්හි අවදනම තක්සේරු කර හඳුනාගෙන ඇති අතර, එම අවදනම්වලට ප්‍රතිචාර වශයෙන් විගණන ක්‍රියාපටිපටි ක්‍රියාවට නැගුවෙමු. ඒ අතර, අපගේ අදහස සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් හා උචිත සාක්ෂි ලබාගත්තෙමු. වංචාව ඵලය කොටගෙන උපදින ද්‍රව්‍යමය අවප්‍රකාශය, ද්වේෂ කරුණු ගෙන හටගන්නා දැයට වඩා ඉහළ තලයක පවතින අතර, වංචාවට දුස්සන්ධානය, ව්‍යාජ ලේඛනසැදීම, අභ්‍යන්තර අඩුපාඩු, අවතිදේශනයන් හෝ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධිගාමීත්වයන් අඩංගු වනු ඇත.
- විගණනයට අදළව අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම, විගණන ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීම, උචිත වාතාවරණයක් තුළ සිදු කළ යුතු නමුදු, සමාගමේ අභ්‍යන්තර පාලනය හි, ඵලදායීතාවය පිළිබඳ අදහසක් ප්‍රකාශ කිරීම සම්බන්ධ අරමුණ සඳහා උචිත නොවනු ඇත.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතබව සහ කළමනාකරණය විසින් සිදු කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදළ හෙළිදරුව් කිරීම්වල සාධාරණ බව ඇගයීමට ලක්කර ඇත
- ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්මේ පදනම මත කළමනාකාරිත්වයේ භාවිතාව පිළිබඳ උචිත බව මත හා සමාගමේ අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් හෝ කොන්දේසි වලට අදළ ද්‍රව්‍යමය සහ සහතික කිරීමේ හැකියාවක් තිබේද යන්න ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අවසාන නිගමනයකට එළඹීම. සැලකියු යුතු විනිශ්චිතභාවයක් පවතින බව අප නිගමනය කරන්නේනම්. මූල්‍ය ප්‍රකාශනයන්හි අදළ හෙළදරව් කිරීම් කෙරෙහි අපගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීමට හෝ, එවැනි හෝ එවැනි හෙළිදරව් කිරීම් පිළිගත නොහැකි නම්, අපගේ මතය වෙනස් කිරීමට අපට අවශ්‍ය වේ. අපගේ නිගමනය පදනම් වී ඇත්තේ අපගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත වන අතර, කෙසේ වෙනත් අනාගත තත්ත්වයන් හේතුවෙන් සමාගම අඛන්ඩ සංකල්පයක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාමට හැකිය.
- සමස්ත ඉදිරිපත් කිරීමක් ලෙස ඇගයීමේ දී, සාධාරණ ඉදිරිපත් කිරීමක් සාක්ෂාත් කරගැනීමට හැකිවන අයුරින් පාදක මූලාශ්‍ර සහ හා සිදුවීම් මූල්‍ය ප්‍රකාශ මගින් නියෝජනය වන බවට සහ අනාවරණයන් ද ඇතුළුව මූල්‍ය ප්‍රකාශවල අඩංගු ව්‍යුහය හා සමස්ත ඉදිරිපත් කිරීම් අගයනු ලැබ ඇත.

වෙනත් කරුණද අතුරතුර අප විසින් පාලන බලධාරීන් හා සමග අපගේ විගණනයේ දී අප හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ඇතුළුව, විගණනයේ සැලසුම් කළ විෂය පථය සහ කාල නියමය සහ සැළකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් සන්නිවේදනය කළෙමු.

අප විසින් ස්වාධීනත්වය පිළිබඳ ආචාරධර්ම පද්ධතියට අනුකූලව, ආචාර ධාර්මික අවශ්‍යතාවයට සරිලන පරිදි ප්‍රකාශයක් සම්පාදනය කර ඇති අතර, අදළ පරිදි අදළ ආරක්ෂක ක්‍රියා මාර්ග සහිතව අපගේ ස්වාධීනත්වය ප්‍රමාණාත්මකව තහවුරු කෙරෙන වෙනත් කරුණු හා සියලු සම්බන්ධතාවයන් සමග සන්නිවේදනය කළෙමු.

එම අදළ පාලන බලධාරීන් හා සන්නිවේදනය කළ කරුණු අතරින් පවත්නා මෙම කාල පරිච්ඡේදය සඳහා මෙම කරුණු මූල්‍ය ප්‍රකාශ එකී කාල පරිච්ඡේදය සඳහා විගණනයේදී කැපීපෙනෙන වැදගත් ස්ථානයක් උසුලනු ඇති බවට හා එසේ හෙයින් ප්‍රධාන විගණන කරුණු කාරණාද වන බව අපි නිශ්චය කර තීරණය කළෙමු. අපගේ විගණන වාර්තාවේ මෙම කරුණු විස්තර කර ඇති පරිදි එකී කරුණක් පිළිබඳ පොදු මහජන අනාවරණයක් සිදු කිරීම නීතිය මගින් හෝ රීති රෙගුලාසි මගින් නිරාවරණය කර, වළක්වා ඇති අවස්ථාවක දී හෝ අතිශය දුර්ලභ වාතාවරණයක් යටතේ එකී සන්නිවේදනය සිදු කිරීම පොදු මහජනඅභිලාෂයන්ගේ යහපත හා ප්‍රතිලාභ ඉක්මවා යාම සිදුවනු ඇතැයි සාධාරණව හා වගන්තිය සහගතව බලාපොරොත්තු වන සහ අහිතකර ප්‍රතිවිපාක ඇතිවනු ඇතැයි යනුවෙන් අපගේ එම වාර්තාව තුළ එම කරුණු සන්නිවේදනය නොකළ යුතුයැයි නිශ්චය කළෙමු.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිළි කරගැනීම් සියල්ල අප ලබාගෙන ඇති අතර, අපගේ විගණන පරීක්ෂාවේදී දිස්වන්නාක් දුරට, සාමගම විසින් නිසි හා යෝග්‍ය ගිණුම් සටහන් තබා ගෙන ඇත.

මෙම ස්වාධීන විගණන වාර්තාව අත්සන් කිරීම සඳහාවූ බැඳියා හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිගේ ආයතනයේ සාමාජිකත්ව අංකය : 4839 වේ.

Ernst & Young

2025 මැයි 6.
කොළඹ.

Partners D K Hulangamuwa FCA FCMA LLB (London), A P A Gunasekera FCA FCMA, Ms Y A De Silva FCA, Ms G G S Manatunga FCA, W K B S P Fernando FCA FCMA FCCA, B E Wijesuriya FCA FCMA, R N de Saram ACA FCMA, Ms N A de Silva FCA, N M Sulaiman FCA FCMA, Ms L K H L Fonseka FCA, Ms P V K N Sajeewani FCA, A A J R Perera FCA ACMA, N Y R L Fernando ACA, D N Gamage ACA ACMA, C A Yalagala ACA ACMA, Ms P S Paranavitane ACA, ACMA LLB (Colombo), B. Vasanthan ACA ACMA, W D P L Perera ACA.

Principals : T P M Ruberu FCMA FCCA MAB (USJ-SL), G B Goudian ACMA, D L B Karunathilaka ACMA, W S J De Silva BSc. (Hons) - MIS MSc - IT, V Shakthivel B.Com (Sp)

A member firm of Ernst & Young Global Limited

සැ.යු.

ඉහත විගණන මතය ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ මුල් විගණන මතයේ පරිවර්තනයකි. එසේ හෙයින් මෙකී පරිවර්තනයන්හි යම් අසමාන තාවයක් හෙවත් විෂමතාවයක් වෙතොත් එහි මුල් ඉංග්‍රීසි පිටපත කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

2025 මාර්තු 31 වන දිනෙන් අවසන් වුණු කාලසීමාව සඳහා මූලික මූල්‍ය දත්ත (විගණනය කරන ලද)

රුපියල් මිලියන	01 අප්‍රේල් 2024 සිට 31 මාර්තු 2025 දක්වා	පොලී ආදායම මත %	01 අප්‍රේල් 2023 සිට 31 මාර්තු 2024 දක්වා	පොලී ආදායම මත %
පොලී ආදයම	8,983	100%	7,581	100%
පොලී වියදම	4,190	47%	4,793	63%
ශුද්ධ පොලී ආදයම	4,793	53%	2,788	37%
වෙළඳ ආදයම	1	0%	1	0%
වෙනත් ආදයම්	723	8%	531	7%
වෙනත් පරිපාලන හා විකුණුම් වියදම්	3,238	36%	2,479	33%
ණය අත්තිකාරම්වල සාමූහික අගය මත වෙන්කිරීම්	(234)	-3%	131	2%
බදු පෙර ලාභය	2,045	23%	972	13%
බදු	1,193	13%	568	7%
කාලපරිච්ඡේදය සඳහා ලාභය	852	9%	404	5%
කාලපරිච්ඡේදය සඳහා වන මුළු විස්තීරණ ආදයම/(වියදම)	36	0%	(4)	0%
කාලපරිච්ඡේදය සඳහා වන මුළු විස්තීරණ ආදයම	888	10%	400	5%

2025 මාර්තු 31 වන දිනට මූලික මූල්‍ය දත්ත (විගණනය කරන ලද)

රුපියල් මිලියන	31.03.2025 දිනට	වත්කම් මත %	31.03.2024 දිනට	වත්කම් මත %
වත්කම්				
මුදල් හා බැංකුවේ ශේෂයන්	4,607	8.07%	4,080	11.15%
රාජ්‍ය ආරක්ෂණ පත්‍ර	2,813	4.92%	2,942	8.04%
අනුබද්ධ සමාගම් වලින් ලැබිය යුතු ශේෂයන්	25	0.04%	-	0.00%
ලැබිය යුතු ගිණුම්	47,616	83.37%	27,800	75.97%
කොටස්හී ආයෝජන	2	0.00%	2	0.01%
දේපළ පිරියත සහ උපකරණ	711	1.24%	638	1.74%
වෙනත් වත්කම්	1,343	2.35%	1,132	3.09%
මුළු වත්කම්	**57,117**	**100.00%**	**36,594**	**100.00%**
වගකීම් සහ ස්කන්ධය				
වගකීම්				
බැංකු සඳහා වෙනත් මූල්‍ය වගකීම්	7,656	13.40%	4,567	12.48%
අනුබද්ධ සමාගම් සඳහා ගෙවිය යුතු ශේෂයන්	17	0.03%	105	0.29%
ගනුදෙනුකරුවන් සඳහා වෙනත් මූල්‍ය වගකීම්	28,314	49.57%	22,180	60.61%
වෙනත් ණය ගැනීම්	12,758	22.34%	2,836	7.75%
වෙනත් වගකීම්	2,268	3.97%	1,692	4.62%
මුළු වගකීම	**51,013**	**89.31%**	**31,380**	**85.75%**
ස්කන්ධය				
ප්‍රකාශිත ප්‍රාග්ධනය	1,996	3.49%	1,996	5.45%
ප්‍රාග්ධන සංචිත	506	0.89%	335	0.92%
රදවාගත් ඉපැයීම	3,600	6.30%	2,829	7.73%
වෙනත් සංචිත	2	0.00%	54	0.15%
මුළු ස්කන්ධය	**6,104**	10.69	**5,214**	14.25%
මුළු වගකීම් සහ ස්කන්ධය	**57,117**	100.00%	**36,594**	100.00%
එක් කොටසකට අදළ ශුද්ධ වත්කම්	30.21%		25.80%	

තෝරාගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක

අයිතමය	31.03.2025 දිනට		31.03.2024 දිනට	
නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මභාවය	**පවතින තත්ත්වය**	**අවම අවශ්‍යතාවය**	**පවතින තත්ත්වය**	**අවම අවශ්‍යතාවය**
අවදනම් මත බර තබන ලද වත්කම්වල ප්‍රතිශතයක් ලෙස මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මභාව අනුපාතය	10.98%	8.50%	15.62%	8.50%
අවදනම් මත බර තබන ලද වත්කම්වල ප්‍රතිශතයක් ලෙස මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මභාව අනුපාතය	13.14%	12.50%	18.54%	12.50%
ඉතුරුම් වගකීම මත වන ප්‍රාග්ධන අනුපාතය	21.56%	10.00%	23.51%	10.00%
වත්කම්වල ගුණාත්මකභාවය (ණය ආයෝජනවල ගුණාත්මකභාවය)				
දළ 3 වන අදියර ණය අනුපාතය		5.54%		11.22%
ශුද්ධ 3 වන අදියර ණය අනුපාතය		3.46%		7.78%
ශුද්ධ 3 වන අදියර ණය අනුපාතය මත වන ප්‍රාග්ධන අනුපාතය		29.33%		45.12%
3 වන අදියර ණය ආවරණ අනුපාතය		37.57%		30.68%
මුළු ණය ආවරණ අනුපාතය		2.82%		4.12%
ලාභදායීත්වය (%)				
පොලී සීමාන්තිකය		11.45%		9.57%
වත්කම් මත ප්‍රතිලාභය (බදු පෙර)		3.11%		1.90%
ස්කන්ධය සඳහා ප්‍රතිලාභය (බදු පසු)		15.05%		7.93%
ආදයම් සඳහා පිරිවැය අනුපාතය		58.69%		74.66%
නියාමන ද්‍රවශීලතාවය				
පවත්නා ද්‍රවශීල වත්කම් මත අවශ්‍ය ද්‍රවශීල වත්කම් අනුපාතය (අවම අවශ්‍යතාවය, 100%)		240%		288%
බාහිර අරමුදල් මත ද්‍රවශීල වත්කම් අනුපාතය		24.00%		29.20%
ආයතනික තොරතුරු				
ශාඛා සංඛ්‍යාව		56		52
බාහිර ණය ශ්‍රේණිගත කිරීම		BBB+ (lka)		BBB (lka)

සහතික කිරීම

සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී. එල්. සී හී පහත අත්සන් කළ ප්‍රධාන විධායක නිලධාරී, මූල්‍ය පාලක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු-අනුකූලතා වන අප, පහත සඳහන් දෑ සඳහා සහතික වෙමු.

1. ඉහත වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කළ ආකෘති හා නිර්වචනයන්ට අනුව සකස් කර ඇත.
2. ඉහත වාර්තාවන්හී ඇතුළත් තොරතුරු විගණනය කරන ලද, සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී. එල්. සී හී මූල්‍ය වාර්තාවලින් උපුටාගෙන ඇත.

(අත්සන් කලේ) ටී. ඒ. අමරසූරිය ප්‍රධාන විධායක නිලධාරී 27/06/2025	(අත්සන් කලේ) සී.වී.නානායක්කාර මූල්‍ය පාලක නිලධාරී 27/06/2025	(අත්සන් කලේ) එම්.එන්.එස්. ඩී සිල්වා ජ්‍යෙෂ්ඨ කළමනාකරු- අනුකූලතා 27/06/2025

සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී. එල්. සී, සිංගර් (ශ්‍රී ලංකා) සමාගමෙහි අනුබද්ධිත ආයතනයක් වශයෙන් 2004 අප්‍රේල් 19 වන දින නීතිගත කරන ලද 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙතින් බලපත්‍රලාභී මුදල් සමාගමකි. ෆිච් ශ්‍රේණිගත කිරීම BBB+ (lka), සමාගම් ලියාපදිංචි අංකය PB 813 PQ

අංක 498, ආර් ඒ ද මෙල් මාවත, කොළඹ 03. දු. කඃ 2100110, 2400400 ෆැක්ස් : 2303715 ඊ-මේල් : financecompany@singersl.com වෙබ් : www.singerfinance.com